**TRANSLATION**

**උ.ප.රා.සේ.කො.චක්‍රලේඛඅංක:** 23/ 2018

මගේඅංකය : **NP/07/10/04/39**
පළාත්රාජ්‍යසේවාකොමිෂන්සභාව,
උතුරු පළාත,
යාපනය.
**29.08.2018**

ලේකම්, කාන්තා කටයුතු අමාත්‍යාංශය,
අධ්‍යක්ෂ,සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරේ විශේෂ ශ්‍රේණිය වන දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරට ජ්‍යෙෂ්ඨතා හා කුසලතා මතපදනම්වූ බඳවා ගැනීම් - 2018**

01.උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරේ විශේෂ ශ්‍රේණියටසීමිත පදනම මත බඳවා ගැනීම් සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති උතුරු පළාත් සමූපකාර සංවර්ධන නිලධාරි සේවයේ 1 ශ්‍රේණියටඅයත් නිලධාරීන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය 2018.09.28 වේ.

**02.** **බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-**

2. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.අනුමත කරන ලද බඳවා ගැනීම් නීතිරීති අනුව සේවා කොන්දේසි බලපැවැත්වේ.

2.2 මෙම දැන්වීම ප්‍රකාරව අයදුම් කරන ඉල්ලුම්කරුවන්ට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂය මගින් ලබා ගන්නා ලකුණු පිළිවෙලින් කුසලතාවය හා ප්‍රමුඛතාවය පදනම් කරගෙන බඳවා ගැනීම් කරනු ලැබේ.

2.3 මෙම පත්වීම් ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු යි.

2.4 ඉහත සඳහන් තනතුරට සමූපකාර සංවර්ධන නිලධාරීන් අයදුම් කරන විට තම අයදුම්පත් තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුයි.දෙපාර්මේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03.වැටුප් පරිමාණය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006ට අනුව,**(MN-7-2006 A)**යන වැටුප් පන්තියේරු.**20,030 – 11x365 – 18x500රුපියල්33,045-/**වේ.මෙම වැටුප්ක්‍රමයේ04 වන වැටුප් පියවර වන රුපියල් 21,125/= ආරම්භ වැටුප වේ.

**04. බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් :-**

**4.1වයස්සීමාව:-**

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා විට වයස් සීමාව බලපාන්නේ නැත.

**4.2සුදුසුකම්:-**

අ.) උතුරු පළාත්සමූපකාර සංවර්ධන නිලධාරීතනතුරේ**1** ශ්‍රේණියේවසර පහක (05) ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර අදාළ වැටුප් වර්ධකයන් පහ (05) ද උපයා තිබිය යුතුයි.

ආ) අදාළ කාල පරිච්ඡේදය තුළ,අදාළකාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී තිබිය යුතුයි.

ඉ) අදාළකාල පරිච්ඡේදය තුළ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී සිටිය යුතුයි

**05 සාමාන්‍ය සුදුසුකම් :-**

අයදුම්කරුවන් උක්ත තනතුරේ සේවාවන් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව නිරෝගිමත් විය යුතු අතර උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය නිලධාරියෙකු විය යුතුයි.

**06 බඳවා ගැනීමේ ක්‍රමය:-**

6.1 උතුරු පළාතේ සමුපකාර සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණියට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ,ආයතන සංග්‍රහය,පළාත් ප්‍රතිපත්තීන් හා නිවේදනයේ **10** වැනි ඡේදයේ විධිවිධානයන්ට අනුව බඳවා ගනු ලැබේ. එමෙන්ම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන අතර මෙම නිවේදනය මගින් දැනුම් දී ඇති සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ.අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා හිමි අයිතිවාසිකම් සියල්ල අවලංගු කරනු ලැබේ.

6.2 සමුපකාර සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණියට අනුමත සේවක සංඛ්‍යාවේ තිබෙන පුරප්පාඩු සංඛ්‍යාවන්ට අනුව ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතා පදනම මත අනුමත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් උසස්වීම් ප්‍රදානය කරනු ලැබේ.

6.3සියලුමඅයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන 2018.09.28 වන දිනට ප්‍රථම තනතුරට අදාළ සියළුම සුදුසුකම් පූර්ණය කර තිබිය යුතුයි සුදුසුකම් රහිත අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. අසත්‍ය තොරතුරු සඳහා වන අඩුවම් :-**

අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුයි.මෙම ව්‍යුහගතසම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නීතිරීති අනුව කිසියම් අයදුම්කරුවෙකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ප්‍රථම හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හෝ පසුව හෝ සුදුසුකම් නැති අයදුම්කරුවකු බවට ඔප්පු වුවහොත් ඔහු සතු අපේක්ෂක හිමිකම වහාම ප්‍රතික්ෂේප කරන අතර ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය තොරතුරක් බවට අනාවරණය වුවහොත් එම නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.ඉහත 6.3 ඡේදයේ සඳහන් කරුණුවලට අයදුම්කරුවන් තම අවධානය යොමු කළ යුතුයි.

**08. අයදුම් කිරීමේ ක්‍රමය:-**

8.1 මෙම නිවේදනය අවසානයේ පළ කර ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව A4(සෙ.මී.21x29 සෙ.මී)ක ප්‍රමාණයෙන් යුත් කඩදාසියකදෙපැත්ත පමණක්උපයෝගී කර,අංක 01 සිට 11 දක්වා පළමු පිටුවෙත් 12 සිට 13 දක්වා දෙවන පිටුවෙත් ආවරණය වන පරිදි අයදුම්පත් සකස් කර ගත යුතුයි.

8.2 අදාළ ආදර්ශ ඉල්ලුම්පත් වලට අනුකූල නොවන, නිවැරදි ලෙස සම්පූර්ණ කර නැති හා අසම්පූර්ණ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නියමිත ලෙස අයදුම්පත් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් එමගින් ඇතිවන ප්‍රතිවිපාකවලට තමන්ම වගකිව යුතුයි. අයදුම්පතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ඵලදායි වන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් වලට අනුකූලව තිබේ ද යන්න අයදුම්කරු විසින් සහතික කරගත යුතුයි. එසේ නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුයි.

8.4 විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018සැප්තැම්බර් මස 28 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් **"ලේකම්, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"**යන ලිපිනයටයොමු කළ යුතුයි.අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

09. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීමට පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

**i.** ජාතික හැඳුනුම්පත.

**ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. **ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය :.**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් විෂයන්ට ලකුණු ප්‍රදානය කෙරේ. (සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100 යි)

| **අනු අංකය** | **ලකුණු ලබා දීමේ විෂය පථය** | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| **1. ජ්‍යෙෂ්ඨතාවය** | | |
| 1.1 | සමූපකාර සංවර්ධනනිලධාරි 1 ශ්‍රේණියේසේවා කාලය තුළ එක් වසරකට ලකුණු 04 බැගින් උපරිම වශයෙන් වසර 15 කට හා . | ලකුණු 60 |
| **2. කාර්ය සාධනය** | | |
| 2.1 | විශාල වශයෙන් ක්‍රියාත්මක වූ මුල් සංගමයේ පරීක්ෂණ නිලධාරී/විමර්ෂණ නිලධාරි ජ්‍යෙෂ්ඨ විගණක නිලධාරී ලෙස කටයුතු කර ඇත්නම් හා විගණන වාර්තා සකස් කර /ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරුවේ නම් ලකුණු 02 බැගින් උපරිම වාර්තා 5 කට | ලකුණු 10 |
| 2.2 | සමූපකාර සංවර්ධන නිලධාරි වශයෙන් සේවය කර වංචා, නීතිවිරෝධී ගනුදෙනු, අඩු වී ඇති භාණ්ඩ යනාදි කටයුතු අල්ලා ගැනීමට වගකීම් දැරුවේ නම් ලකුණු 01 බැගින් උපරිම වශයෙන් වාර්තාවන් 05 කට | ලකුණු 10 |
| 2.3 | මැදිහත්කරු වශයෙන්/විමර්ෂණ නිලධාරි වශයෙන් කටයුතු කර/විමර්ෂණ සොයා ගැනීම් සඳහා ලකුණු 03 බැගින් උපරිම වාර්තා 03 කට | ලකුණු 09 |
| 2.4 | විසුරුවාහැරීම/සමූපාකාර සංගමයේ සුදුසුකම් ලත් විසුරුවාහරින්නෙකු වශයෙන් සේවය කිරීම නිමිත්තෙන් ලකුණු ½ බැගින් උපරිම වශයෙන් සංගම් 8 කට | ලකුණු 04 |
| **03.විශේෂ සුදුසුකම්** | | |
| 03.1 | අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමානව උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා | ලකුණු 04 |
| 03.2 | ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා සහතික සඳහා ලකුණු 01 බැගින් උපරිම සහතික 02 කට | ලකුණු 02 |
| 03.3 | විදේශ රටක සති (02)දෙකකට වැඩි කාලපරිච්ඡේදයක් නිල වශයෙන් සහභාගි වූ ඩිප්ලෝමා සහතික සඳහා ලකුණු 01 බැගින් උපරිම වශයෙන් සහතික දෙකකට (02) | ලකුණු 02 |
| **03.4** | මව්භාෂාව සිංහල/දෙමළ/ඉංග්‍රීසි හැර වෙනත් භාෂා හැකියාව සඳහා (ලිවීමට හා කියාවීමට) ලකුණු 01 බැගින් | ලකුණු 04 |
| | **එකතුව** | **ලකුණු 100** |

11. මෙම නිවේදනයේ සඳහන් හෝ සඳහන් නොකරන ලද කරුණුවලින් අදහස් වන හෝ අදහස් නොවන කිසියම් අදහසක් පැහැදිලි නොවන අවස්ථවක දී ඒ සම්බන්ධයෙන් වෙනස් කිරීමක් අවශ්‍ය වුවහොත්එම අවශ්‍යතාවය සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගන්නා තීරණය අවසන් තීරණය වේ. එමෙන්ම විශේෂ හේතුන් මත අදාළ ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි අවස්ථාවක් උදා වූ විටෙක ඒ සම්බන්ධයෙන් ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

12. සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන අදාළ තනතුර සඳහා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.එම පුරප්පාඩු කොටස් වශයෙන්හෝ සම්පූර්ණයෙන් පිරවීමේ තීරණය ගනු ලබන්නේ පත්වීම් බලධාරියා විසින් ය.

***අ.සිවබාලසුන්දරන්***
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත

**පිටපත:** **01.** ප්‍රධාන ලේකම්, උතුරු පළාත - දැ. ගැ. ස.